**<u>අන්තර් පළාත් ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන්</u>**
**<u>සියළුම පළාත් පොදු ක්‍රමවේදයක් යටතේ කටයුතු කිරීම</u>**

**ස්ථාන මාරු අපේක්ෂිත තනතුර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව තිබීම හා එහි පුරප්පාඩු පැවතිය යුතුය.**

ඒ අනුව, අන්තර් පළාත් ස්ථානමාරු සම්බන්ධයෙන් අවශ්‍ය පොදු නිර්ණායක පහත පරිදි වන අතර, අන්තර් පළාත් ස්ථාන මාරු සම්බන්ධයෙන් පහත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

| | අවශ්‍ය ලිපි ලේඛන | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු පිටපත් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/91 යටතේ ස්ථාන මාරු අයදුම්පත්‍රය | මුල් පිටපත් තුනක් |
| 02 | නිලධාරියාගේ ස්ථිර පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපත | සහතික කරන ලද ඡායා පිටපත් තුනක් |
| 03 | අයදුම්කරු හෝ කලත්‍රයා අදාළ පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු බව සනාථ කල ග්‍රාම නිලධාරියාගේ සහතිකය (DS 04) | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 04 | අන්තර් පළාත් ස්ථාන මාරුව ලබා ගත් පසු අදාළ පළාතේ අවුරුදු 05ක් සේවය කිරීම හා අදාළ පළාතේ පුරප්පාඩු පවතින ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට මනාපය පළ කරන ලිපිය | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 05 | සේවය ස්ථිර කරන ලද ලිපිය (පත්වීම් ස්ථිර කල ලිපිය) | සහතික කරන ලද පිටපත් තුනක් |
| | සේවය ස්ථිර කර නැතිනම් අදාළ පළාත් රාජ්‍ය සේවයට අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බවට සනාථ කරන විභාග කොමසාරිස්වරයා / විශ්ව විද්‍යාල රෙජිස්ට්‍රාර්/අදාල ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පහත සඳහන් ලේඛන<br>• අ.පො.ස.(සා/පෙ) හා අ.පො.ස.(උ/පෙ) විභාග ප්‍රතිඵල ලේඛන<br>• උපාධි සහතිකය/ අධ්‍යාපන විද්‍යා පීඨ සහතිකය/ පුහුණු සහතිකය/ ඩිප්ලෝමා සහතිකය සනාථ කරන ලද පිටපත<br>• වැඩ භාරගත් ලිපියේ පිටපත | සහතික කරන ලද පිටපත් තුනක් |

| | | |
|---|---|---|
| 06 | අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියේ ජොෂ්ඨතා ලේඛනයේ අගට තැබීමේ කොන්දේසීන්ට යටත්ව අදාළ පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය දැක්වූ ලිපියක් | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 07 | ස්ථාන මාරුව සඳහා අයදුම් කරන දිනට ප්‍රථම වසර තුනක් (03) (පවත්නා වර්ෂය ඇතුළුව) වැටුප් රහිත නිවාඩු ලබා ඇත/ ලබා නැත යන වාර්තාව ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද වාර්තාව | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 08 | නිලධාරියාට විරුද්ධව විනය කටයුතු පවතින බව /නැති බව ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද වාර්තාව | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 09 | අදාල නිලධාරියාගේ සේවා කාලය තුළ ඒ හා සම්බන්ධ කිසියම් හේතුවක් නිසා එම නිලධාරියාට විරුද්ධව අධිකරණ කටයුතු කිසිවක් සිදු නොවූ බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද වාර්තාව | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 10 | නිලධාරියාට විරුද්ධව බරපතල මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ විගණන පරීක්ෂණයක් තිබේ /නැත යන කරුණු පිළිබඳ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද වාර්තාව | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 11 | මෙම නිලධාරියා පළාත් සභාවේ වියදමින් විශේෂ පුහුණුවක් ලබා තිබේනම් පුහුණුවට අදාළ ගිවිසුමේ අනිවාර්ය සේවා කාලය අවසන් කර තිබීම හෝ කිසියම් බැඳුම්කරයකට යටත් වි ඇත්නම් එයින් නිදහස් කර ඇත/නැත යන කරුණු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ වාර්තාව | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 12 | ස්ථාන මාරුව අයදුම්කරන අයදුම්කරුගෙන් වත්මන් සේවා ස්ථානයෙන් අය විය යුතු ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ වාර්තාව | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |

එසේම උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේදී ඉහත ලිපි ලේඛනවලට අමතරව පහත ලිපියද ඉදිරිපත් කළ යුතුය.

| | **අවශ්‍ය ලිපි ලේඛන** | **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු පිටපත් සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | උතුරු පළාතට අන්තර්ග්‍රහණය කිරීමට ප්‍රථම දිනට තනතුරු උසස්වීම සේවා ප්‍රතිලාභ හා සුභසාධන කටයුතු සම්බන්ධයෙන්, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම තීරණය පිළිගන්නා බවට නිලධාරියාගේ මනාප ලිපිය | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |

එසේම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේදී ඉහත ලිපි ලේඛනවලට අමතරව පහත ලිපි ලේඛනද ඉදිරිපත් කළ යුතුය.

| අනු අංකය | **අවශ්‍ය ලිපි ලේඛන** | **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු පිටපත් සංඛ්‍යාව** |
|---|---|---|
| 01. | "බස්නාහිර පළාත තුල අදාළ තනතුරේ පුරප්පාඩු පවතින ඕනෑම සේවා ස්ථානයක රාජකාරි කිරීමට එකඟ වන බවට ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම" යන අවශ්‍යතාවයද ඇතුලත් වන පරිදි සංශෝධනය කිරිම | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 02 | "අදාල තනතුරේ නියමිත ශ්‍රේණියේ යොෂ්‍යතා ලේඛනයේ නියමිත ස්ථානයේ තැබීම" යනුවෙන් සංශෝධනය කිරිම | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |
| 03 | "පූර්ව සේවා කාලය තුලදී වසර 03 ක් ඇතුළත අසාමාන්‍ය ලෙස වැටුප් රහිත නිවාඩු ලබා නොතිබිය යුතුයි.මෙම කරුණ සනාථ කර ගැනිම සඳහා ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය" යනුවෙන් සංශෝධනය කිරිම. | මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් |